**ඉමදූව ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

-----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 22 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ඉමදූව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඇත්ගන්දර වත්ත වෙන්දේසි ඉඩමේ ඉදිකරන ලද බහු කාර්යය ගොඩනැගිල්ලේ වටිනාකම තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි. | වත්කම් තක්සේරු කර ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | විගණන ගාස්තු සඳහා වෙන් කළ යුතුවේ. | 2020 ගිණුමෙන් නිවැරදි කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භ කරන ලද රු.600,000 ක් වටිනා කබරගල පාසල් මාවත සකස් කිරීමේ කර්මාන්තය සඳහා ණයහිමි ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි. | බැරකම් නිවැරදිව ගිණුම් ගතකළ යුතුවේ. | කර්මාන්තය අතර මග නවතා ඇති බැවින් ගිණුම් ගත කර නැත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සභා අරමුදල් යොදවා සිදු කරන ලද රු.126,305 ක් වූ කර්මාන්ත දෙකක් බාහිර අරමුදල් යොදවා කළ කර්මාන්ත වශයෙන් සලකා ගිණුම් තැබීම හේතුවෙන් ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර හා ණයගැතියන් ද එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි. | නිවැරදිව ගිණුම් ගතකළ යුතුවේ. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (ඉ) සභාවට ආධාර වශයෙන් ලැබෙන වත්කම් වෙන්ව හඳුනාගත හැකි ලෙස ගිණුම් තබා නොතිබුණි. | වත්කම් වෙන් වෙන්ව ගිණුම් ගතකළ යුතුවේ. | වත්කම් වෙන් වෙන්ව හඳුනා ගැනීමට අපහසු බව සහ ඉදිරියේ දී නිවැරදිව ගිණුම් ගත කරමි. |
| (ඊ) කර්මාන්ත ඉටුකර නොතිබිය දී 2019 වර්ෂයට පෙර සිට රු.26,004,990 ක් කර්මාන්ත ණය ලෙස දිගින් දිගටම පොත්වල පෙන්නුම් කරමින් තිබූ අතර, ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ජංගම වත්කම් නිවැරදිව ගිණුම් ගතකළ යුතුවේ. | ඉදිරියේ දී ලේඛන නිවැරදි කර, ගිණුම් නිවැරදි කරමි. |

### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ලැබිය යුතු ගිණුම්**<br>2019 වර්ෂයට පෙර සිට පැවත එන ආදායම් ණයගැති ශේෂය රු.55,131,568 ක් හා එම ශේෂය තුළ වූ රු.4,697,825 ක වටිනාකම වූ ශේෂ වසර 05 කටත් අධික කාලයක සිට පැවති අතර, එම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ශේෂ හඳුනා ගෙන ලැබිය යුතු ණය ශේෂ කඩිනමින් අයකර ගතයුතුවේ. | ඇතැම් ශේෂ අවිනිශ්චිත ආදායම් වන අතර, එම ශේෂයන් අනුමැතිය මත කපා හැරීමට කටයුතු කරමි. |
| **(ආ) ගෙවිය යුතු ගිණුම්**<br>සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම වගකීම් ශේෂය තුළ වූ රු.38,979,805 ක ශේෂයක් වසරකටත් වැඩි කාලයක් ගෙවා නොතිබූ අතර, ඉන් රු.4,509,520 ක් වූ වසර 05 කටත් අධික කාලයක සිට ගෙවිය යුතු ශේෂයන් ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කළ යුතුවේ. | ඉදිරියේ දී අවසාන ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කරමි. |

### 1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.155,114,170 ක් වූ ගිණුම් විෂයයන් 13 ක් පිළිබඳ අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | රීති 99 | රු.2,072,483 ක් වූ ගෙවීම් වලට අදාල වවුචර්පත් 42 ක් සහතික කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී එවැනි වැරදි සිදු නොවීමට වගබලා ගන්නා බව දන්වමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 571(1)(2)(3) | වර්ෂ 02 ක් ඉක්මවන ලද රු.3,999,274 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ධාවන තත්ත්වයේ පවතින වාහන 11 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී ඉන්ධන පරීක්ෂාවක් සිදු කරමි. |
| (ඈ) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | ප්‍රයෝජනයට ගැනීමෙන් තොරව පවතින වාහන 04 ක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,063,089 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,642,431 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බැංකු ගිණුමේ ප්‍රමාණවත් මුදල් ශේෂයක් නොතිබිය දී ගෙවීම් කිරීම නිසා ප්‍රධාන මුදල් පොතේ 2018 මාර්තු 31 දින සිට 2019 ජුනි 30 දින දක්වා සෘණ ශේෂයක් පැවති අතර, 2019 ජුනි 30 දින එම සෘණ ශේෂය රු.3,448,395 ක් දක්වා වර්ධනය වී තිබුණි. | මුදල් පොත අනුව ප්‍රමාණවත් ශේෂයක් නොමැති විට ගෙවීම් නොකළ යුතුවේ. | ඉදිරියේ දී එවැනි වැරදි සිදු නොවීමට වගබලා ගනිමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් | 616,400 | 546,890 | 416,333 | 752,722 | 518,900 | 610,325 | 255,422 | 594,425 |
| බදු කුලී | 4,234,000 | 1,072,150 | 927,150 | 606,600 | 4,771,000 | 888,150 | 989,950 | 461,600 |
| බලපත්‍ර ගාස්තු | 190,000 | 274,450 | 226,350 | 225,466 | 150,000 | 212,000 | 260,700 | 177,366 |
| | 5,040,400 | 1,893,490 | 1,569,833 | 1,584,788 | 5,439,900 | 1,710,475 | 1,506,072 | 1,233,391 |

### 2.3.2 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 05 කට අධික කාලයක සිට පැවත එන හිඟ බලපත්‍ර ගාස්තු ශේෂය රු.177,366 ක් විය. | හිඟ බලපත්‍ර ගාස්තු අයකළ යුතුවේ. | බලපත්‍ර හිඟයක් ඇතිවිය නොහැකි අතර, එම ශේෂ කපාහැරීමට සමාලෝචිත වර්ෂයේ නඩු පවරා ඇති බව දන්වමි. |

**2.3.3 බදු කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වසර 05 කට අධික කාලයක සිට පැවත එන හිඟ බදු කුලී ශේෂය රු.461,600 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සභාව වෙන් කිරීමේ දී ඇති වූ හිඟය ඉවත් කිරීම ගැටළු සහගත වී ඇති අතර, පනතේ 152 වගන්තිය ප්‍රකාරව නඩු පවරා ඇති බව දන්වමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුවේ. | ඉදිරියේ දී ඵලදායී සැලැස්මක් සකස් කරමි. |

**(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වෙන් කිරීමකින් තොරව එකතු කරනු ලබන කසළ සභාවට අයත් හොරතොට කන්ද භූමියට බැහැර කරමින් තිබූ අතර, මෙම ස්ථානයට කසළ බැහැර කිරීම සඳහා පරිසර බලපත්‍රයක් ද නොතිබුණි. | කසල කළමනාකරණය සඳහා විධිමත් සැලැස්මක් සකස් කළ යුතු අතර, පරිසර බලපත්‍රයක් ලබා ගත යුතුවේ. | ඉදිරියේ දී සැලැස්මක් සකස් කර, බලපත්‍රයක් ලබා ගැනීමට කටයුතු කරමි. |

**(ඇ) තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටුකර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතුවේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | වෙළඳ සංකීර්ණයේ පහත මාලයේ පැවති කඩ කාමර 12 ක්, 2019 දෙසැම්බර් 31 දින වන විටත් වෙළඳ ප්‍රජාව වෙත ලබා දීමට කටයුතු කර නොතිබුණි. | බදු දීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී බදු දීමට කටයුතු කරමි. |
| (ආ) | වීථි පහන් නඩත්තුව සඳහා විදුලිබල මණ්ඩලය සමඟ 2006 වර්ෂයේ සිටම ගිවිසුම්ගත නොවීම හේතුවෙන් වීථි පහන් නඩත්තුව සඳහා දැරූ වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වී තිබුණි. 2019 දෙසැම්බර් 31 දක්වා ප්‍රතිපූර්ණය කර නොගත් මුදල රු.5,222,770 ක් විය. | සභා අරමුදලින් වීථි පහන් නඩත්තුව සඳහා දැරූ වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේ දී ඒ සම්බන්ධව කටයුතු කරමි. |
| (ඇ) | වැඩියෙන් ගෙවූ වැටුප් රු.47,625 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැඩියෙන් ගෙවූ වැටුප් නැවත අයකර ගත යුතුවේ. | 2020 ජුනි මස සිට අයකර ගැනීමට කටයුතු කරමි. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අක්කර 03 ක පමණ භූමියක 2014 වර්ෂයේ ආරම්භ කර තිබුණු කුරුඳු වගාවෙන් 2015 වර්ෂයේ දී රු.255,868 ක් හා 2016 වර්ෂයේ රු.305,000 ක් උපයා තිබුණි. ටෙන්ඩර් ගිවිසුම අවසන් වූ 2018 අප්‍රේල් 06 න් පසු කුරුඳු වගාව මගින් කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණි. | සභාවට ලැබිය යුතු ආදායම් එකතු කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී ආදායම් ලබා ගැනීමට කටයුතු කරමි. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | විවිධ තනතුරු වලට අයත් සේවකයින් 08 දෙනෙකු නිත්‍ය තනතුරට අදාළ නොවන වෙනත් රාජකාරිවල නිරත කර තිබුණි. | නිත්‍ය රාජකාරී පැවරීමට හා රාජකාරී කටයුතු විධිමත් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි |
| (ආ) | අනුමත තනතුරු වල පැවති පුරප්පාඩු 11 ක් සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත තනතුරක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක සංඛ්‍යාව විධිමත් කර ගත යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

### 3.5 ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | හොරතොට කන්ද ඉඩමෙන් අක්කර 06 ක පමණ ප්‍රමාණයක් ඵලදායී ආර්ථික කටයුත්තක් සඳහා යොදවාගෙන නොතිබුණි. | භූමි ප්‍රමාණය ප්‍රයෝජනයට ගත යුතුවේ. | ඉදිරියේ දී ඒ සම්බන්ධව කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රු.4,984,798 ක වියදමින් ඉදිකර තිබූ ආදාහනාගාරය 2018 වර්ෂයේ සිට අක්‍රියව පැවතුණි. | ආදාහනාගාරය අළුත්වැඩියා කිරීමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේ දී අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගන්නා බව දන්වමි. |
| (ඇ) | 2007 වර්ෂයේ පරිත්‍යාගයක් ලෙස ලැබී තිබූ 10 kw ජෙනරේටරයක් නිෂ්ක්‍රීයව පැවතුණි. | අළුත්වැඩියාව හෝ අපහරණය කළ යුතුවේ. | අළුත්වැඩියාවට ඉහළ වියදමක් වැය වන බැවින් ඉදිරියේ දී අළුත්වැඩියා කිරීමට කටයුතු කරමි. |

**4.** **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1** **අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර විගණන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතු වේ. | ඉදිරියේදී ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට කටයුතු කරන බව දන්වමි. |